(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 76.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 ජූලි 11 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍ය

ගරු **රන්ජන් රාමනායක මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු ෆයිසර් මුස්තාපා මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**

**ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) නියෝජ්‍ය කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIX කොටස සහ නවවැනි කාණ්ඩයේ XI කොටස;

(ii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIV කොටස;

(iii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVIII කොටස සහ තෙවැනි කාණ්ඩයේ VI කොටස; සහ

(iv) 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ VII සහ XXXV කොටස්

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද, මුද්‍රණය කළ යුතුයැයිද නියෝග කරන ලදී.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු විජිත හේරත් මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු ආනන්ද අලුත්ගමගේ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2015/2016 වර්ෂය සඳහා සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2014 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) (i) රත්නපුර, නව රෝහල පාර, අංක 25/1 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. ඩී. එස්. කුලරත්න මහතාගෙන් ලැබුණු 2019.05.22 දිනැති පෙත්සම;

(ii) තිහගොඩ, කපුදූව, වලව්වත්ත, "ධම්මික" යන ලිපිනයෙහි පදිංචි එම්. ඩී. ජී. ජී. රණවීර මහත්මියගෙන් ලැබුණු 2019.03.11 දිනැති පෙත්සම;

(iii) කෑගල්ල, හැලමඩ, ගල්කඩුව, "මහ ගෙදර" යන ලිපිනයෙහි පදිංචි පී. ජී. පතිරත්න මෙනෙවියගෙන් ලැබුණු 2019.04.23 දිනැති පෙත්සම; සහ

(iv) වැලිගම, කප්පරතොට, "ආරියනිවස" යන ලිපිනයෙහි පදිංචි එස්. පී. හේවාවිතාරණ මහතාගෙන් ලැබුණු 2019.04.29 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) අච්චුවේලි, අච්චුවේලි දකුණ යන ලිපිනයෙහි පදිංචි නාගරාජා පකීරදන් මහතාගෙන් ලැබුණු 2019.01.05 දිනැති පෙත්සම ගරු ඩග්ලස් දේවානන්ද මහතා විසින් පිළිගන්වන ලදී.

(3) කන්තලේ, 87 වැනි පෙදෙස, අංක 21 දරන ස්ථානයෙහි පදිංචි එම්. එම්. චාන්දනී මාරකෝන් මහත්මියගෙන් ලැබුණු 2019.05.31 දිනැති පෙත්සම ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) :** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරිය වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2019 ජූලි 23 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය, ගරු චමින්ද විජේසිරි මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 52(6) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයා වෙත පවරන ලදී.

**6. අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංගත්වය :** විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2019 ජූලි 10),—

"වර්ෂ 2019 අප්‍රේල් 21 වැනි පාස්කු ඉරිදා දින කොළඹ, මීගමුව සහ මඩකලපුව යන ප්‍රදේශවල සිදු වූ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ඇතුළු දෙසිය පනහකට අධික පිරිසක් ඝාතනය වීමත්, තවත් පන්සීයයකට ආසන්න පිරිසක් තුවාල ලැබීමත් සහ එකී බෝම්බ ප්‍රහාර හේතුවෙන් වූ දේපළ හානිය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුව වෙත නිල වශයෙන් නිසි තොරතුරු ලැබී තිබියදී සාපරාධී නොසැලකිල්ලෙන් පහත සඳහන් කෙරෙන ක්‍රියාවන් කරමින් හෝ නොකර හැරීමෙන් ද:—

(අ) 2019.05.08 වැනි දින අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ පරිදි 2014 වර්ෂයේ සිට අයිඑස්අයිඑස් (ISIS) ජාත්‍යන්තර ඉස්ලාම් අන්තවාදී සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ පිරිස් විවිධ සබඳතා පැවැත්වූ බවත්, විවිධ ක්‍රියාකාරකම්වල යෙදුන බවත් දැන සිටියදී ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට අපොහොසත් වීම;

(ආ) විවිධ ඉස්ලාම් ආගමික අන්තවාදී සංවිධාන මුස්ලිම් සමාජය තුළ ක්‍රියාත්මක වන බවට මුස්ලිම් ප්‍රජාව විසින්ම විවිධාකාරයෙන් ආණ්ඩුව සහ වගකිව යුතු ආයතන දැනුවත් කර තිබියදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අපොහොසත් වීම;

(ඇ) කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට විවිධ අවස්ථාවල එල්ල කරන ලද තර්ජන සහ ප්‍රහාර සම්බන්ධයෙන් 2019 අප්‍රේල් 21 වැනි දින බෝම්බ පුපුරවාගෙන මිය ගිය සහරාන් හෂීම් සහ 2019 අප්‍රේල් 26 වැනි දින සයින්දමරුදූහිදී බෝම්බ පුපුරුවාගෙන මිය ගිය ඒ. එල්. එම්. නියාස් යන අයවලුන්ට එරෙහිව අධිකරණය විසින් වරෙන්තු නිකුත් කර තිබියදී සහ එකී වරෙන්තුකරුවන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ප්‍රසිද්ධව විවිධ ක්‍රියාකාරකම්වල යෙදී සිටියදී ඔවුන් අත්අඩංගුවට ගැනීමට හෝ නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කිරිමට අපොහොසත් වීම;

(ඇ) වර්ෂ 2018 දෙසැම්බර් 24 වැනි දින මාවනැල්ලේ දී බුද්ධ ප්‍රතිමාවන්ට හානි කිරීම සම්බන්ධයෙන් සහරාන් හෂීම් ප්‍රමුඛ කණ්ඩායමක් සම්බන්ධ බවට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විසින් ජාතික බුද්ධි අංශය වෙත 2018 දෙසැම්බර් 28 වැනි දින දැනුම් දී තිබියදීත්, හා මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් සැක කරමින් කිහිපදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබියදීත් විමර්ශන කටයුතු ඉදිරියට ගෙන යාම වළක්වමින් ඒ සඳහා මැදිහත් වීම් තිබුණු බව ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු විසින්ම ප්‍රකාශ කර තිබීම;

(ඉ) මෙම ප්‍රහාරයන්ට සැලකිය යුතු කාලයකට පෙර සිට ශ්‍රී ලංකාව තුළ ඉස්ලාම් අන්තවාදී සංවිධානවල විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂයෙන් සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් අයිඑස්අයිඑස් (ISIS) සංවිධානය සමඟ බැඳී කටයුතු කිරීම ඇතුළු කරුණු සම්බන්ධයෙන් නීතිමය සහ ආරක්ෂක පියවර ගැනීමට අපොහොසත් වීම;

(ඊ) ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අග්‍රාමාත්‍යවරයා ආරක්ෂක මණ්ඩල සභාවාරයන්ට සහභාගි නොවීමෙන් රටවැසියා වෙත ඔහු විසින් ඉටු කළ යුතු මූලික වගකීම් පැහැර හැරීම;

(උ) විදේශීය ඔත්තු සේවාවන් විසින් ශ්‍රී ලංකාව තුළ කතෝලික දේවස්ථාන හා හෝටල් ඉලක්ක කරගෙන මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කෙරෙන බවත්, එයට සම්බන්ධ පුද්ගලයන් හා ඔවුන්ගේ දුරකථන අංක, ජාතික හැඳුනුම්පත් අංක ඇතුළු නිශ්චිත තොරතුරු ලබා දී තිබියදී එම තොරතුරු මත පදනම්ව කටයුතු කිරීම පැහැර හැරීම;

වැඩිමනත් ලෙස 2019.04.21 වැනි දින ප්‍රහාරයන්ට පෙර අදාළ විදේශ ඔත්තු සේවාවන් විසින් නැවතත් මෙම ප්‍රහාරයන් සම්බන්ධයෙන් නිශ්චිතව අනතුරු අඟවා තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පැහැර හැරීම;

(ඌ) 2019.04.11 වැනි දින නියෝජ්‍ය පොලිස්පති, විශේෂ ආරක්ෂක දිසාව ප්‍රියලාල් දසනායක මහතා විසින් ''Information of an alleged plan attack'' යන ශීර්ෂය හා අංක DIG/SPR/126/4.19 දරන ලිපිය මඟින් 2019 අප්‍රේල් 21 වැනි දින නිශ්චිත ස්ථාන ඉලක්ක කරගෙන සැලසුම්ගත මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ලවන බවට, එනම් ''ජාතික තව්හීත් ජමාත් නායක මොහොමඩ් සහරාන් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට තොරතුරක් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව මඟින් ලබා දී තිබූ වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින්'' යනුවෙන් සඳහන් ලිපිය පහත නම් සඳහන් එනම්,

- අධ්‍යක්ෂ/ඇමති ආරක්ෂක කොට්ඨාසය
- අධ්‍යක්ෂ / අධිකරණ ආරක්ෂක කොට්ඨාසය
- අධ්‍යක්ෂ / විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය
- වැඩ බලන අධ්‍යක්ෂ/තානාපති ආරක්ෂක කොට්ඨාසය (iv)
- වැඩ බලන අධ්‍යක්ෂ/ විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය (v)

අයවලුන්ට පූර්වයෙන් ලබා දී තිබීම හා ඒ පිළිබඳ කටයුතු කිරීම පැහැර හැරීම, යන ඉහත කරුණු අනුව 2019.04.21 වැනි දින සිවිල් වැසියන් ඉලක්ක කරගනිමින් සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය අවශ්‍යයෙන්ම වළකා ගැනීමට හෝ හානිය අවම කරගත හැකිව තිබූ හෙයින්ද;

(එ) 2019.04.21 වැනි දින සිදු කරනු ලැබූ ප්‍රහාර මාලාවෙන් පසුව අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍යවරුන් විසින් එකී ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් වූ වගකීම භාර නොගෙන එම වගකීම වෙනත් පාර්ශ්වයන්ට පැවරීමට උත්සාහ කරමින්ද,

රජයේ අමාත්‍යවරුන් විසින් වගකීම් විරහිත, පරස්පර සහ සාවද්‍ය ප්‍රකාශයන් සිදු කරමින් රටේ සාමාන්‍ය ජනජීවිතය හා මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් ව්‍යාකූලභාවයක් සහ අනාරක්ෂිතභාවයක් ඇති වන පරිදි කටයුතු කර ඇති හෙයින්ද;

(ඒ) 2019.04.21 වැනි පාස්කු ඉරිදා දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් විමර්ශන ක්‍රියාවලියට බාධා කරමින් සහ එකී අපරාධයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කරමින් හෝ වළක්වමින් ආණ්ඩුවේ සමහර අමාත්‍යවරුන් කටයුතුකර ඇති හෙයින්ද;

(ඔ) 2019.04.21 වැනි දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර මාලාවෙන් පසුව තවත් එවැනි ප්‍රහාර මාලාවක් ඇති වීම හෝ වෙනත් ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු කිරීම මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පූර්ණ නීති මාලාවක් රාජ්‍යය සතුව තිබියදී 2019.05.13 වැනි දින ගම්පහ ප්‍රදේශයේ සහ වයඹ පළාතේ සිදු වූ අන්තවාදී ප්‍රචණ්ඩකාරී ක්‍රියා, එනම් මනුෂ්‍ය ඝාතන, දේපළ හානි සහ ජනතාව අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා නිසි අවධානයකින් සහ වගකීමෙන් කටයුතු නොකිරීමේ සහ එකී සිද්ධීන් මැඩපැවැත්වීම සඳහා ගතයුතු නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම මත ජනතාව සම්බන්ධයෙන් රජය විසින් ඉටුකළ යුතු යුතුකම් වගකීම් නිසි ආකාරයෙන් ඉෂ්ඨ කිරීම පැහැර හැරීමෙන් සහ 2019.04.21 වැනි දින ප්‍රහාර මාලාවෙන් පසුව රටෙහි විවිධ ජනවර්ගයන් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් සහ ප්‍රහාරයන්වලට යොමු වීමේ ප්‍රවණතාවයක් තිබියදී එකී ප්‍රහාරයන් වළක්වා ගැනීමට කටයුතු නොකළ හෙයින්ද;

(ඕ) එකී පාස්කු ඉරිදා දින ප්‍රහාරයෙන් මාසයක් ගතවී තිබියදී, රටෙහි සාමාන්‍ය ආර්ථික ක්‍රියාවලිය නැවත ගොඩනැගීමට අසමත් වී ඇති හෙයින්ද, රටෙහි පාසල් සහ සරසවි අධ්‍යාපන ක්‍රියාවලිය නැවත ගොඩනැගීමට අසමත් වී ඇති හෙයින්ද, රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය නැවත යථා තත්ත්වයට පත් කිරීමට අසමත් වී ඇති හෙයින්ද, ආණ්ඩුවක් වශයෙන් රටෙහි ජනතාව වෙත තමන් විසින් ඉටුකළ යුතු වගකීම් සහ වගවීම් පැහැර හැර ඇති හෙයින්ද; සහ

2019.04.21 වැනි දින ප්‍රහාර මාලාව වැළැක්වීමට අසමත් වූ නිසා මෙන්ම ඉන් පසුවද රටේ ආරක්ෂක තත්ත්වය සහ සිවිල් ජන ජීවිතය යථා තත්ත්වයට පත් නොකිරීම නිසා ඇති වී තිබෙන අරාජික තත්ත්වය මත රටේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට විදේශ රාජ්‍යයන්ට ඉඩකඩ හරිමින් ක්‍රියා කර ඇති හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව සම්බන්ධයෙන් තවදුරටත් විශ්වාස භංගත්වයට පත්ව ඇති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 62/'19]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී

(අ.භා. 12.43 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය යුතුය''යි, කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.34 ට ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

“ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය”යි, නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.32 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

“ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය යුතුය”යි, සංචාරක සංවර්ධන, වනජීවි සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.19 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 6.08 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 92; විරුද්ධව 119; යනුවෙන් බෙදී, එය නිෂ්ප්‍රභ විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දෙසිය අට දෙනෙකු (208) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Rauff Hakeem | No |
| G 002. Mangala Samaraweera | No |
| G 004. John Amaratunga | No |
| G 005. Gayantha Karunatileka | No |
| G 006. Lakshman Kiriella | No |
| G 007. Ranil Wickremesinghe | No |
| G 009. Tilak Marapana | No |
| G 010. Wajira Abeywardana | No |
| G 011. Ravi Karunanayake | No |
| G 012. Rajitha Senaratne | No |
| G 013. Rishad Bathiudeen | No |
| G 014. Patali Champika Ranawaka | No |
| G 015. Kabir Hashim | No |
| G 016. Sajith Premadasa | No |
| G 017. Akila Viraj Kariyawasam | No |
| G 018. Malik Samarawickrama | No |
| G 019. Mano Ganesan | No |
| G 020. Navin Dissanayake | No |
| G 021. J.M. Ananda Kumarasiri | No |
| G 022. P. Harrison | No |
| G 023. R.M. Ranjith Madduma Bandara | No |

| | |
|---|---|
| G 024. Arjuna Ranatunga | No |
| G 025. Palany Thigambaram | No |
| G 026. Chandrani Bandara | No |
| G 027. Thalatha Atukorale | No |
| G 028. Abdul Haleem | No |
| G 029. Sagala Ratnayake | No |
| G 030. Harin Fernando | No |
| G 031. Daya Gamage | No |
| G 032. Ravindra Samaraweera | No |
| G 033. Sujeewa Senasinghe | No |
| G 034. Harsha De Silva | No |
| G 035. Ajith P. Perera | No |
| G 037. Ruwan Wijayawardene | No |
| G 038. Vasantha Senanayake | No |
| G 039. Lucky Jayawardana | No |
| G 040. Dilip Wedaarachchi | No |
| G 041. Niroshan Perera | No |
| G 042. A.D. Premadasa | No |
| G 043. Wasantha Aluwihare | No |
| G 044. Vijayakala Maheswaran | No |
| G 045. Eran Wickramaratne | No |
| G 046. Ranjith Aluvihare | No |
| G 047. J.C. Alawathuwala | No |
| G 048. Vadivel Suresh | No |
| G 049. Ranjan Ramanayake | No |
| G 050. Ashok Abeysinghe | No |
| G 051. Ajith Mannapperuma | No |
| G 052. Edward Gunasekara | No |
| G 053. Anoma Gamage | No |
| G 054. Karunarathna Paranawithana | No |
| G 055. Palitha Kumara Thewarapperuma | No |
| G 056. Nalin Bandara Jayamaha | No |
| G 057. Buddhika Pathirana | No |
| G 058. A.H.M. Fowzie | No |
| G 059. Piyasena Gamage | No |
| G 060. Lakshman Senewiratne | No |

| | |
|---|---|
| G 061. Wijith Wijayamuni Zoysa | No |
| G 062. D.M. Swaminathan | No |
| G 064. Ameer Ali Shihabdeen | No |
| G 065. Indika Bandaranayake | No |
| G 066. Palitha Range Bandara | No |
| G 068. H.M.M. Harees | No |
| G 069. Seyed Ali Zahir Moulana | No |
| G 070. M.S. Thowfeek | No |
| G 071. Manusha Nanayakkara | No |
| G 072. Abdullah Mahrooff | No |
| G 073. Sirinal de Mel | No |
| G 074. Anura Sidney Jayarathne | No |
| G 075. K.K. Piyadasa | No |
| G 076. Lakshman Ananda Wijemanne | No |
| G 077. A. A. Wijethunga | No |
| G 078. Hector Appuhamy | No |
| G 079. Sisira Kumara Abeysekara | No |
| G 080. Thushara Indunil Amarasena | No |
| G 081. A. Aravindh Kumar | No |
| G 082. Velu Kumar | No |
| G 083. Nalaka Prasad Colonne | No |
| G 084. Chandima Gamage | No |
| G 085. Kavinda Heshan Jayawardana | No |
| G 086. Mylvaganam Thilakarajah | No |
| G 087. Mayantha Dissanayake | No |
| G 088. Sujith Sanjaya Perera | No |
| G 089. Hirunika Premachandra | No |
| G 090. Bandula Lal Bandarigoda | No |
| G 091. M. Ibrahim Muhammad Mansoor | No |
| G 092. S.M. Marikkar | No |
| G 093. Imran Maharoof | No |
| G 094. Ishak Rahuman | No |
| G 095. Mujibur Rahuman | No |
| G 096. Harshana Rajakaruna | No |
| G 097. Thusitha Wijemanna | No |
| G 098. Rohini Kumari Wijerathna | No |

| | |
|---|---|
| G 099. Chaminda Wijesiri | No |
| G 100. Hesha Withanage | No |
| G 101. Sandith Samarasinghe | No |
| G 102. Chathura Sandeepa Senaratne | No |
| G 103. Wijepala Hettiarachchi | No |
| G 104. Ashu Marasinghe | No |
| G 105. Jayampathy Wickramaratne | No |
| G 106. Mohamadu Nazeer | No |
| G 107. S.M. Mohamed Ismail | No |
| G 115. Indika Anuruddha Herath | Yes |
| G 116. Malith Jayathilake | Yes |
| O 001. Sarath Amunugama | Yes |
| O 002. Sumedha G. Jayasena | Yes |
| O 003. W.D.J. Senewiratne | Yes |
| O 004. S.B. Dissanayake | Yes |
| O 005. Dinesh Gunawardana | Yes |
| O 006. Nimal Siripala de Silva | Yes |
| O 007. Chamal Rajapaksa | Yes |
| O 008. Mahinda Rajapaksa | Yes |
| O 009. Mahinda Amaraweera | Yes |
| O 010. Arumugan Thondaman | Yes |
| O 011. Pavithradevi Wanniarachchi | Yes |
| O 012. Salinda Dissanayake | Yes |
| O 013. Wimal Weerawansa | Yes |
| O 015. A.D. Susil Premajayantha | Yes |
| O 016. Gamini Lokuge | Yes |
| O 017. Rajavarothiam Sampanthan | No |
| O 018. Mavai S. Senathirajah | No |
| O 019. Anura Dissanayake | Yes |
| O 020. Ven. Athuraliye Rathana Thero | Yes |
| O 021. Selvam Adaikkalanathan | No |
| O 022. Anura Priyadharshana Yapa | Yes |
| O 023. Bandula Gunawardana | Yes |
| O 026. Janaka Bandara Tennakoon | Yes |
| O 027. C.B. Ratnayake | Yes |
| O 028. Muthu Sivalingam | Yes |

| | |
|---|---|
| O 029. Mahinda Yapa Abeywardena | Yes |
| O 030. Dilan Perera | Yes |
| O 031. Keheliya Rambukwella | Yes |
| O 032. Kumara Welgama | Yes |
| O 033. Dullas Alahapperuma | Yes |
| O 034. Johnston Fernando | Yes |
| O 036. T.B. Ekanayake | Yes |
| O 037. Dharmalingam Sithadthan | No |
| O 039. Nihal Galappaththi | Yes |
| O 040. Vijitha Herath | Yes |
| O 041. S.M. Chandrasena | Yes |
| O 042. Mahindananda Aluthgamage | Yes |
| O 043. Ranjith Siyambalapitiya | Yes |
| O 044. Piyankara Jayaratne | Yes |
| O 045. Vasudeva Nanayakkara | Yes |
| O 046. Lakshman Yapa Abeywardene | Yes |
| O 048. Rohitha Abeygunawardana | Yes |
| O 050. Chandima Weerakkody | Yes |
| O 051. Dayasiri Jayasekara | Yes |
| O 052. Faiszer Musthapha | Yes |
| O 054. Susantha Punchinilame | Yes |
| O 055. Lasantha Alagiyawanna | Yes |
| O 056. Premalal Jayasekera | Yes |
| O 057. K. Thurairetnasingam | No |
| O 058. Seeniththamby Yoheswaran | No |
| O 059. Sunil Handunnetti | Yes |
| O 060. Bimal Rathnayake | Yes |
| O 061. Thilanga Sumathipala | Yes |
| O 063. Sudarshini Fernandopulle | Yes |
| O 064. Weerakumara Dissanayake | Yes |
| O 065. Sriyani Wijewickrama | Yes |
| O 067. Siripala Gamalath | Yes |
| O 068. Duleep Wijesekara | Yes |
| O 070. Lakshman Wasantha Perera | Yes |
| O 071. Nishantha Muthuhettigamage | Yes |
| O 072. Shantha Bandara | Yes |

| | |
|---|---|
| O 073. Arundika Fernando | Yes |
| O 074. Tharanath Basnayake | Yes |
| O 075. Nimal Lanza | Yes |
| O 076. Anuradha Jayaratne | Yes |
| O 077. S. Shritharan | No |
| O 078. E. Saravanapavan | No |
| O 079. M.A. Sumanthiran | No |
| O 080. Nalinda Jayathissa | Yes |
| O 081. H.R. Sarathie Dushmantha | Yes |
| O 082. K. Kader Masthan | Yes |
| O 083. Angajan Ramanathan | Yes |
| O 084. Ananda Aluthgamage | Yes |
| O 085. S. Viyalanderan | Yes |
| O 087. Wimalaweera Dissanayaka | Yes |
| O 088. Jayantha Samaraweera | Yes |
| O 089. P. Udayashantha Gunasekara | Yes |
| O 090. Dilum Amunugama | Yes |
| O 091. Mohan Priyadarshana De Silva | Yes |
| O 092. T. Ranjith De Zoysa | Yes |
| O 093. Ramesh Pathirana | Yes |
| O 094. Vijitha Berugoda | Yes |
| O 095. Roshan Ranasinghe | Yes |
| O 096. Lohan Ratwatte | Yes |
| O 097. Kaveendiran Kodeeswaran | No |
| O 098. I. Charles Nirmalanathan | No |
| O 099. Gnanamuthu Srineshan | No |
| O 100. S. Sivamohan | No |
| O 101. Namal Rajapaksa | Yes |
| O 102. Janaka Wakkumbura | Yes |
| O 103. Vidura Wickramanayaka | Yes |
| O 104. Thenuka Vidanagamage | Yes |
| O 105. Shehan Semasinghe | Yes |
| O 106. Kanaka Herath | Yes |
| O 107. D.V. Chanaka | Yes |
| O 108. Sisira Jayakody | Yes |
| O 109. Piyal Nishantha De Silva | Yes |

| | |
|---|---|
| O 110. Sanath Nishantha Perera | Yes |
| O 111. S. Premarathna | Yes |
| O 112. Tharaka Balasuriya | Yes |
| O 113. Shanthi Sriskandarasa | No |
| O 114. Prasanna Ranatunga | Yes |
| O 115. Prasanna Ranaweera | Yes |
| O 116. Kanchana Wijesekara | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව මහ ලේකම්වරයා විසින් පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තුන්දෙනෙකුගේ (03) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 003. Gamini Jayawickrama Perera | No |
| G 063. Field Marshal Sarath Fonseka | No |
| G 067. Faizal Cassim | No |

**7. කල් තැබීම :** එකල්හි වේලාව අ.භා. 6.30 පසුකර තිබුයෙන්, අ.භා. 6.41 ට කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2019 ජුලි 12 වැනි සිකුරාදා පූ.භා. 10.30 වනතෙක් කල් ගියේය.